75 YEARS

STABILITY FOR PROSPERITY

1950-2025

ශ්‍රී ලංකා මහ බැංකුව

இலங்கை மத்திய வங்கி

CENTRAL BANK OF SRI LANKA

# රුපියල් දෙදාහ

## සමරු මුදල් නෝට්ටුව


ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

අංක.30, ජනාධිපති මාවත

කොළඹ 1

ශ්‍රී ලංකාව

+94 112477587 currency@cbsl.lk www.cbsl.gov.lk






## නෝට්ටුවේ ඉදිරිපස




## නෝට්ටුවේ පිටුපස




# රුපියල් 2000 සමරු මුදල් නෝට්ටුව

රුපියල් 2000 වටිනාකමකින් යුත් මෙම සමරු මුදල් නෝට්ටුව 2025 අගෝස්තු 28 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ 75 වන සංවත්සරය සනිටුහන් කිරීම නිමිත්තෙන් නිකුත් කරන ලදී.








## සැලකිල්ලෙන් බලන්න 1 2

මුදල් නෝට්ටුව හරහා ආලෝකය ගමන් කරන ලෙස අල්ලාගෙන කඩුව රැගත් සිංහයා සහිත දිය සලකුණ සැලකිල්ලෙන් බලන්න.

මුදල් නෝට්ටුව හරහා ආලෝකය ගමන් කරන ලෙස අල්ලාගෙන කඩුව රැගත් සිංහයාගේ රුව සහිත විනිවිද පෙනෙන ආරක්ෂණ සලකුණ සැලකිල්ලෙන් බලන්න.

මුදල් නෝට්ටු නිර්මාණයෙහි ඇතුළත් ඉතා කුඩා අක්ෂර සැලකිල්ලෙන් බලන්න.




## ඇල කර බලන්න 3

මුදල් නෝට්ටුව තිරස් අතට ඇල කර බැලීමේ දී ආරක්ෂණ නූලේ ඇතුළත් කර ඇති කොළඹ ප්‍රදීපාගාර ඔරලෝසු කණුව සහ 2000 ඉලක්කම් නිල් වර්ණයේ සිට කොළ වර්ණය දක්වා වෙනස් වීම නිරීක්ෂණය කරන්න.




## ස්පර්ශයෙන් හඳුනා ගන්න 4

උස්ව මුද්‍රණය කර ඇති නෝට්ටුවේ 2000 වටිනාකම සහ ශ්‍රී ලංකා මහ බැංකුව නමැති පාඨය ස්පර්ශයෙන් හඳුනා ගන්න.

එමෙන්ම එක් එක් තීරුව අවසානයේ දියමන්තියක හැඩයක් සමග උස්ව මුද්‍රිත තීරු හය ස්පර්ෂයෙන් හඳුනා ගන්න. මෙම සලකුණ දෘශ්‍යාබාධිත පුද්ගලයින්ට නෝට්ටුවේ වටිනාකම හඳුනා ගැනීමට උපකාර වේ.







## පරීක්ෂා කරන්න 5

මුදල් නෝට්ටුව පාර ජම්බුල (UV) ආලෝක කිරණ වලට යොමු කොට පරීක්ෂා කිරීමේදී, නෝට්ටුවේ දෙපසම ද්විත්ව වර්ණයෙන් යුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ 75 වන සංවත්සර තේමාව පෙන්නුම් කරන අතර මුදල් නෝට්ටුවේ ඉදිරිපස කොළඹ නගරයට අලුතින් එක් වූ ගොඩනැගිලි ඈතින් දිස්වෙන ආකාරය ද පිළිබිඹු වේ.

මුදල් නෝට්ටුවේ වටිනාකම ද පාර ජම්බුල (UV) ආලෝක කිරණ වලට යොමු කොට පරීක්ෂා කළ හැකි වේ. මෙය මුදල් ගණින යන්ත්‍ර මගින් ද පරීක්ෂා කළ හැකි සලකුණක් වේ.